www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ස්ටැලින්වාදී සීපීඑම් ත්‍රයි වාර්ෂික රැස්වීම ඉන්දියාවේ කොන්ග්‍රස් පක්ෂය ප්‍රමුඛ ආන්ඩුවට සහායදීම යලි සපථ කරයි

## India: Stalinist CPM's triennial meeting to reiterate support for Congress Party-led governmentl

**නන්ද වික්‍රමසිංහ හා කේ රත්නායක විසිනි**

**2008 මාර්තු 29**

ඉන්දියාවේ වඩාත්ම විශාල ස්ටැලින්වාදී පක්ෂය ද, වාම පෙරමුනේ ප්‍රමුඛ හවුල්කරුවා ද වන ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) (සීපීඅයිඑම්) සිය 19 වන සමුලුව මාර්තු 29 වන දින සිට අප්‍රේල් 3 වන දින දක්වා දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ කොයිම්බතෝර් හිදී පවත්වයි.

2004 මැයි මාසයේ පටන් සීපීඅයිඑම් සහ වාම පෙරමුන කොන්ග්‍රස් පක්ෂය ප්‍රමුඛ හවුල් ආන්ඩුවට "පිටත සිට" සහාය දී තිබෙන අතර, එම ආන්ඩුව ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශ උග්‍ර පීඩාවට ලක් කරමින් නාගරික ප්‍රදේශ ආර්ථික අනාරක්ෂිත භාවයට හා වැඩී යන දරිද්‍රතාවයට ඇද දමමින් සමාජය ගිනිගන්වන නව ලිබරල් ප්‍රතිසංස්කරන ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කර තිබේ.

ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) හා එහි වාම පෙරමුනු හවුල්කරුවන්ගේ මන්ත්‍රී ඡන්ද නොලදහොත්, කොන්ග්‍රස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ප්‍රගතිශීලී සන්ධාන ආන්ඩුව (යූපීඒ) බිඳ වැටෙනු ඇත.

බටහිර බෙංගාලය, කේරල හා ත්‍රිපුර යන ප්‍රාන්ත රාජ්‍යයන් තුනෙහි ම ආන්ඩු පිහිටුවාගෙන ඇති වාම පෙරමුන ආර්ථික වර්ධනය හා කාර්මීකරනයේ නාමයෙන් යූපීඒ ආන්ඩුව ගෙනයන්නාවූ, ආයෝජකයන්ට වාසි සලසන එම ප්‍රතිපත්තීන්ම ක්‍රියාත්මක කරමින් සිටිති.

තෙ වසරකට වරක් පැවැත්වෙන පක්ෂ සමුලුවට සූදානම් වෙමින් සිටියදී පක්ෂ නායකත්වය තමන් හා යූපීඒ ආන්ඩුව අතර යම්කිසි වෙනසක් මවා පෑමේ ප්‍රෝඩාකාරී උත්සාහයක නිරත වූහ. සීපීඅයිඑම් ප්‍රධාන ලේකම් ප්‍රකාශ් කරාත් කියා සිටියේ මින් ඉදිරියට තම පක්ෂය ආන්ඩුව තුල ඉන්දීය ධනේශ්වරයේ සම්ප්‍රදායික පක්ෂය වන කොන්ග්‍රසයටත්, ඉන්දියාවේ අනෙක් ප්‍රධාන පක්ෂය වන හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂයටත් (බීජේපී) පිටින් "තුන්වන විකල්පයක්" ගොඩනැගීමේ අවශ්‍යතාවය අවධාරනය කරනු ඇති බවය. කරාත් තවදුරටත් කියා සිටියේ, 2005 දී අත්සන් තබන ලද ඉන්දියානු-එක්සත් ජනපද ආරක්ෂක සැකැස්මේ ගිවිසුම කටුගා දමන ලෙස සීපීඅයිඑම් ආන්ඩුවට බලකරනු ඇති බවයි.

එහෙත් සීපීඅයිඑම් නායකත්වය, යූපීඒ ආන්ඩුව හා වාම පෙරමුනු ප්‍රාන්ත ආන්ඩු තුන ම ක්‍රියාත්මක කරන ව්‍යාපාරික "හිතවාදී" ප්‍රතිපත්තිවලට තම සහයෝගය දිගටම හිමිවන බව ප්‍රසිද්ධ ප්‍රකාශයන්හි මෙන්ම 19 වන කොන්ග්‍රසයට ඉදිරිපත් කොට ඇති දේශපාලන යෝජනාවන් තුල ද යලිත් අවධාරනය කොට ඇත.

කරාත් *අවුට්ලුක්* සඟරාවේ මාර්තු 14 වන දින කලාපයෙහි පලකල සම්මුඛ සාකච්ඡාවක් තුල මෙසේ පැවසීය. යූපීඒ ආන්ඩුව "අපගේ සහාය ලබන බැවින් නොසෙල්වී එහි නිල කාලය අවසන් වන තෙක්ම පවතිනු ඇත. එය ඇද වැටුනොත් ඒ අප නිසානම් නොවේ."

එනමුදු සීපීඑම් නායකයන් එසේ සහතික වන්නේ, සිය සමුලු යෝජනාව තුල මෙසේ පිලිගන්නා ගමන්ය: "යූපීඒ ආන්ඩුව මුලුමනින්ම යොමු වී ඇත්තේ මහා ව්‍යාපාරිකයට හා විදේශ ප්‍රාග්ධනයට වාසි සලසන ප්‍රතිපත්ති ඉදිරියට ගෙනයාමට ය."

## සීපීඅයිඑම් හා නන්දිග්‍රාම් ගොවි ඝාතනය

සීපීඅයිඑම් නායකත්වය, නව දිල්ලියේ බල සංස්ථාපිතය තුල තමන්ට ලැබී ඇති බලපෑම ද, 2006 මැයි මාසය තුල කේරලයේ හා බටහිර බෙංගාලයේ දී හා 2002 පෙබරවාරියේ පුංචි ත්‍රිපුර ප්‍රාන්තයේ දී වාම පෙරමුනට හිමිවූ මැතිවරන දිනුම් ද තමන් ශක්තිමත් වෙමින් සිටින බව කියාපෑම සඳහා යොදා ගනියි.

යථාර්ථය නම් ස්ටැලින්වාදීන් ඔවුන්ගේ සමුලුව පවත්වන්නේ නැගී එන අර්බුදයක කොන්දේසි යටතේ ය යන්නයි. මෙම අර්බුදයේ මූලයන් පවතින්නේ එක් අතකින් තමන් ඉන්දියාවේ පීඩිතයන් වෙනුවෙන් හඬ නගන බවට ද අනෙක් අතට මාක්ස්වාදයේ පුරෝගාමී සටන්කරුවන් බවට ද සීපීඅයිඑම් කරන්නා වූ ව්‍යාජ මවා පෑම් ද අනෙක් අතට ලෝක ධනේශ්වරය සඳහා ලාභ ශ්‍රම කෙතක් බවට පත් කිරීම සඳහා නව ලිබරල්

ප්‍රහාර වැඩ සටහන ක්‍රියාවට දැමීමේ දී සීපීඅයිඑම් බාරගෙන ඇති ප්‍රමුඛ ක්‍රියා කලාපය ද අතර පවත්නා උග්‍ර පරස්පරවිරෝධය තුලය.

බටහිර බෙංගාලයේ නන්දිග්‍රාම්හි පසුගිය වසරේ ඇතිවූ සිද්ධීන් එනම් ඉන්දුනීසියාව පදනම් කර ගත් සලීම් ගෲප් නම් බහුජාතික සමාගමකට අයත් විශේෂ ආර්ථික කලාපය සඳහා රාජ්‍යයේ මැදිහත්වීමෙන් ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව පැන නැගි ගොවි කැරැල්ල සීපීඅයිඑම් විසින් ලේ වැකි අයුරින් මැඬීම ඉන්දියාව පුරා කම්කරුවන්ගේ ද ගොවීන්ගේ ද බුද්ධිමතුන්ගේ ද ගැරහීමට, පිලිකුලට හා කෝපයට ලක් විය. දිගු කලක් සීපීඅයිඑම් සමඟ සහයෝගීව සිටි ප්‍රමුඛ වාමාංශික ලේඛකයන් හා විද්‍යාර්ථීන් අතුරින් බොහෝ දෙනෙක් මෙම ප්‍රචන්ඩත්වය හෙලා දුටහ.

නූතන ඉන්දියාවේ ප්‍රමුඛතම ඉතිහාසඥයා ලෙස පුලුල්ව පිලිගැනෙන සුමිත් සර්කාර් ද නවකථා කතෘ අරුන්දතී රෝයි ද තවත් ප්‍රමුඛ වාමාංශික බුද්ධිමතුන් ද සීපීඅයිඑම් හෙලාදක්නා විවෘත සංදේශයක් නිකුත් කර ඇත. එහි මෙසේ සඳහන් විය. "අද දින සීපීඅයිඑම් සමඟ 'පොදු මතයක් දරා සිටීම' වනාහි සීමාන්තික ධනේශ්වර සංවර්ධනය සඳහා පාරිසරික උත්සුකයන් නොතකා හැරීම ද මහා පරිමානයෙන් ජනතාව අවතැන් කිරීම ද න්‍යෂ්ටික බල ශක්තිය ද කරපින්නා ගැනීමකි.

"පසුගිය දශකය පුරාම ක්‍රියාත්මක කරන ලද බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුවේ ප්‍රතිපත්ති, නව ලිබරල් වැඩසටහන බාරගෙන සිටින අනෙකුත් පක්ෂවලින් කිසි සේත්ම වෙන් කල නොහැකි තැනකට මෙම පක්ෂය පත් කොට තිබේ. සැබවින්ම, '1970 ගනන් හා 1980 ගනන්වල දී වාම පෙරමුනු ආන්ඩුව බෙංගාල ප්‍රාන්ත රාජ්‍යයේ තහවුරු කල ඉඩම් ප්‍රතිසංස්කරන වැනි වැදගත් අත්දැකීම් දැන් වේගයෙන් ආපසු හරවනු ලැබේ. ඉඩම් ප්‍රතිසංස්කරන පිලිබඳ බටහිර බෙංගාල රාජ්‍ය ලේකම් සැපයූ සංඛ්‍යා ලේඛනවලට අනුව පසුගිය වසර පහ තුල සංගතයන්ට අඩු මිලට පැවරීම සඳහාත් ඉහල පන්තික නිවාස ගොඩනැඟීම සඳහාත් ආන්ඩුව ඉඩම් අල්ලාගැනීම නිසා ප්‍රාන්තය තුල ඉඩම් නැති ගොවීන් සංඛ්‍යාව ඉමහත් ලෙස වැඩිවී තිබේ."

සීපීඅයිඑම් හි පරිවාර පක්ෂ වන ෆෝවඩ් බ්ලොක්, රෙවලූෂනරි සෝෂලිස්ට් පාටි (ආර්එස්පී), හා ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයි) වැනි බටහිර බෙංගාල වාම පෙරමුනු ආන්ඩුවේ හවුල්කරුවන් පවා නන්දිග්‍රාම්හිදී සීපීඅයිඑම් කල වැඩවලින් ඈත්ව සිටීම ඇඟට ගුන බව සිතාගත්හ.

සීපීඅයිඑම් සමුලු යෝජනාව එහි අවසානයේ දී නන්දිග්‍රාම් සිදුවීම් සීපීඅයිඑම් විරෝධී ප්‍රකෝපකරනයන් ලෙස අඟවන කෙටි පේලි කිහිපයක් මගින් යටගසා දමා ඇත. යෝජනාව කියා පාන්නේ දක්ෂිනාංශික හා අන්ත වාමාංශික (නක්සලයිට්) බලවේගයන් නන්දිග්‍රාම්හි ගොවීන් " සීපීඅයිඑම් විරෝධී උද්ඝෝෂනයකට" ඒකරාශී කර ගත් බවකි. යෝජනාව මීට හේතුව වසයෙන් දක්වන්නේ "එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමඟ මූලෝපායික සන්ධානයකට විරුද්ධ වෙමින් ද, යූපීඒ ආන්ඩුවේ නව ලිබරල්වාදී නැඹුරුව ගැන විමසිලිමත් වෙමින් ද තීරනාත්මක අරගලයක් ගෙනයන තම පක්ෂය ජාතික දේශපාලනය තුල" ඉටුකරන "ප්‍රමුඛ ක්‍රියා කලාපය" යි.

ජාවාරම්කරුවන් සාමාන්‍ය බදුවලින් නිදහස් කරන, කම්කරු අයිතීන් ක්‍රියාත්මක නොකරන විශේෂ වර්ගයක ආර්ථික කලාප නිර්මානය කරන ලෙස බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුවට බලපෑම් කල ඉන්දියානු හා විදේශ ප්‍රාග්ධනය සතුටු කරන සීපීඅයිඑම්, නන්දිග්‍රාම් හි දී දෙවරක් ම ගොවීන් ඝාතන සිදු කලේය යන සත්‍ය කාරනය කුමන පරිමානයක හෝ ස්ටැලින්වාදී බොරු මගින් පිසදා යටගසා දැමිය නොහැකිය. සීපීඅයිඑම් පක්ෂයේ ප්‍රමුඛත්වයෙන් යුත් බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුවේ නියෝග මත 4000 දෙනෙකුට වැඩි ආයුධ සන්නද්ධ රාජ්‍ය ආරක්ෂක හමුදා 2007 මාර්තු 14 වන දින නන්දිග්‍රාමයට කඩාවැදුනු අතර ඔවුන්ගේ මග ඇහිරීමට උත්සාහ කල ගොවීන්ට වෙඩි තබා 14 දෙනෙක් මරා දැමූහ. ඉන්පසු නොවැම්බර් මස මුලදී ප්‍රදේශය තුල සාමය ආරක්ෂා කොට ආන්ඩුවේ අනසක පිහිටුවීමේ මෙහෙයුමක් යටතේ සීපීඅයිඑම් ඔවුන්ගේ ම මැර කල්ලි නන්දිග්‍රාම් මතට මුදා හලේ ය. මෙම කන්ඩායම් තවත් මිනිසුන් 8 දෙනෙක් මරා දමා ගෙවල් බිමට සමතලා කරමින් වැසියන් 18,000 කට වැඩි සංඛ්‍යාවක් නන්දිග්‍රාම් ප්‍රදේශයෙන් පලවා හැරියෝය.

දක්ෂිනාංශික ත්‍රිනමුල් කොන්ග්‍රසය හා කම්කරු පන්තියේ වෙනත් සතුරන් ඉන්දියානු දේශපාලනය දකුනට තල්ලු කිරීමට නන්දිග්‍රාම් සිදුවීම් ගසාකෑමට උත්සාහ කල බව නිසැකයෙන්ම ඇත්ත ය; එහෙත් මේ සඳහා ඉඩ සලසා දුන්නෝ මහා ව්‍යාපාරිකයට ලේ නාගත් කූටාලියන් ලෙස සේවය කල ස්ටැලින්වාදියෝ ය.

තවද ස්ටැලින්වාදියෝ ම දක්ෂිනාංශිකයන්ගේ ව්‍යාපාරයට නිවට ලෙස යටත් වූහ. නන්දිග්‍රාමය පිලිබඳව කම්කරුවන්ගේ හා සමාජවාදයට නැඹුරු බුද්ධිමතුන්ගේ විරෝධතා ඉවත දැමූ සීපීඅයිඑම් පසුගිය නොවැම්බරයේ නන්දිග්‍රාමයේ කල මැර ප්‍රහාරයෙන් පසු තමන් දේශපාලනිකව උපදෘතව ඇතැයි ඒත්තු ගනිමින් ජාත්‍යන්තර පරමානුක බලශක්ති ආයතනය (අයිඒඊඒ) සමඟ සාකච්ඡා කිරීමට තමන්ට ඉඩදිය යුතුයයි කියාසිටි යූපීඒ ආන්ඩුවේ ඉල්ලීමට අනුගත වී එයට ඉඩ දීමට වාම පෙරමුන ද පොලඹා ලීය. අයිඒඊඒ සාකච්ඡා ඉන්දු - එක්සත් ජනපද සිවිල් න්‍යෂ්ටික

සහයෝගිතා ගිවිසුම ක්‍රියාවට නැගීම දෙසට තැබූ ප්‍රධාන පියවරක් විය.

තවත් කරුනු දෙකක් සඳහන් කල යුතුය. වාම පෙරමුන 2006 මැයි මාසයේදී බටහිර බෙංගාලය තුල යලි තේරී පත්වූයේ ප්‍රාන්තය තුල නව ලිබරල් ප්‍රතිසංස්කරන ක්‍රියාත්මක කිරීමේ ලා හොඳම වාහකය ස්ටැලින්වාදීන් බව ඒත්තු ගෙන සිටි මහා ව්‍යාපාරිකයන්ගේ නොමඳ සහාය තුලිනි. නන්දිග්‍රාම්හිදී ද ඊට පෙර සිංගුර්හි නව ටාටා මෝටර් රථ කම්හලක වැඩ බිමෙහිදී ද සිය කාර්මිකකරන ක්‍රියාමාර්ගයට එල්ල වූ විරෝධය සීපීඅයිඑම් විසින් නිර්දය ලෙස මර්දනය කල ආකාරය ඉන්දියානු ප්‍රාග්ධනයේ ද විදේශ ප්‍රාග්ධනයේ ද නියෝජිතයන් විසින් සාදරයෙන් පිලිගනු ලැබ තිබුනි. නන්දිග්‍රාම් මතට කඩාවැදීමට ප්‍රාන්ත පොලිසියට නියෝග දීමෙන් යන්තම් සති කිහිපයකට පසුව 2007 අප්‍රේල් මාසයේදී , බටහිර බෙංගාල මහ ඇමති හා සීපීඑම් දේශපාලන මන්ඩල සාමාජික බුද්ධාඩෙබ් බට්ටාචාර්ජි දිගු කලක් තිස්සේ කරමින් සිටි ඉල්ලීමක් වොෂින්ටනය සපුරා දුන්නේය. එනම් එක්සත් ජනපද ආන්ඩුවේ නිලධාරීන් හා ගිජු ආයෝජකයන් හමුවීමේ එහි සංචාරයක් සඳහා නිල ඇරයුමකට අනුමැතිය වොෂින්ටනයෙන් ලබා ගැනීම ය.

දෙවැනි හා වඩාත් වැදගත් කරුන නම් කොන්ග්‍රසය හා ඉන්දියානු ධනේශ්වරයේ නව ලිබරල් වැඩ සටහනට එරෙහිව අරගලය මෙහෙයවනවා වෙනුවට සීපීඅයිඑම් හා වාම පෙරමුන කරන්නේ එම වැඩසටහන ක්‍රියාවට නැගීමේ අත්‍යවශ්‍යම පංගුවක් ඉටුකිරීම බවය. සීපීඅයිඑම් මෙහෙයවීම යටතේ වාම පෙරමුන තමන් බලයේ සිටින ප්‍රාන්තවල ධනේශ්වර ප්‍රතිව්‍යුහකරන ක්‍රියාවට නැගීමටක්‍රියාකරනවා පමනක් නොවේ, ඊට අමතරව ස්ටැලින්වාදීහු දක්ෂිනාංශික ආන්ඩු ගනනාවක් ම එක පිට එක බලයේ පවත්වා ගෙන යාමට උදව් දෙමින් නව ලිබරල් ප්‍රතිසංස්කරනවලට එරෙහි පීඩිතයන්ගේ මහා විරෝධය සැර බාලකිරීම සඳහා ධනේශ්වරයට බලපෑම් කිරීම අරමුනු කොට ගත් බෙලහීන විරෝධතා කටයුතු තුල කොටුකර තැබීමට හැකි සෑම අයුරින්ම සිය ශක්තිය මෙහෙයවා වැඩ කලහ.

ලෝක ධනේශ්වර ආර්ථිකයට මුලුමනින්ම ඒකාග්‍රවීම උදෙසා ජාතික ආර්ථිකය පරිපාලනය කිරීම හා රාජ්‍යයේ මූලික සංවර්ධනය අතහැර දැමීම මගින් ඉන්දීය ධනේශ්වරයේ පන්ති මූලෝපායේ යෝධ වෙනසක් ඇතිකිරීමට ප්‍රමුඛත්වය ගත් 1991 බලයට පත් කොන්ග්‍රස් පක්ෂයේ සුලුතර ආන්ඩුව දිගින් දිගට ම බලයේ තබාගැනීමට සීපීඅයිඑම් මූලිකත්වය දරන වාම පෙරමුන උදව් දුනි. ඉන්පසුව 1996-98 කාලයේ නව ලිබරල් ප්‍රහාරය පවත්තා ගෙනගිය "එක්සත් පෙරමුනු ආන්ඩුවට" ස්ටැලින්වාදීන් නිල වශයෙන් සම්බන්ධව නොසිටි නමුත් ආන්ඩුවේ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ ද ප්‍රාදේශීය හා කුල පදනමක පිහිටා කටයුතු කල ධනේශ්වර පක්ෂ එකට තබා ගනිමින් ජරපත් සභාගය පවත්වා ගැනීමේදී ද ඔවුහු ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටුකලහ.

වත්මන් කොංග්‍රස්-නීත ආන්ඩුව පාර්ලිමේන්තු බහුතරයක් පවත්වාගෙන යාම සඳහා පමනක් නොව, සමාජ කෝපය සැර බාල කිරීමේ ඊට වැඩි වැදගත් කමක් දරන කාර්යයක් සඳහා ද ස්ටැලින්වාදීන් මත්තේ දැඩි ලෙස වාරුවී සිටියි.

ස්ටැලින්වාදීන් හා වෘත්තීය සමිති එක් දින වැඩ වර්ජන මාලාවක් ක්‍රියාත්මක කල නමුදු සමාජ අර්බුදයට මුහුනදීම සඳහා තමන්ගේ ම ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කරමින් කම්කරු පන්තිය ස්වාධීන දේශපාලන බලවේගයක් ලෙස බලමුලුගැන්වීම කරා මෙහෙයවීමට හරස් වූහ. ඒවෙනුවට ඔවුන්ගේ අරමුන වූයේ කොන්ග්‍රසයේ නායකත්වයෙන් යුත් යූපීඒ ආන්ඩුවට තවදුරටත් කම්කරු පන්තිය යටත් කර තබාගැනීම සහතික කර දීමයි.

ප්‍රාග්ධනය කැඳවා ගැනීමෙහි ලා තමන්ගේ ම උත්සාහයන්ට කම්කරු විරෝධතා හරස් නොවන බවට වගබලාගැනීමේ දුෂ්කර ප්‍රයත්නයක ඔවුහු නිමග්නව සිටියහ. වාම පෙරමුනු ආන්ඩුව විසින් තොරතුරු තාක්ෂනික සමාගම්වල වැඩ නතරකිරීම් මුලුමනින්ම පාහේ තහනම් කර තිබුනු බටහිර බෙංගාලයේ කම්කරුවන් එක් දින ජාතික වැඩ වර්ජනයකින් තොරතුරු තාක්ෂනික ක්ෂේත්‍රය අඩාල කිරීමෙන් පසුව සීපීඅයිඑම් නායකයකු වූ මහා ඇමති භට්ටාචාර්ජී ප්‍රකාශ කලේ "මෙම තර්ජනය (වැඩ වර්ජන) ගැන මම හොඳට දනිමි. එවන් කඩාකප්පල්කාරීන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගන්නා බවට මම ඔබට සහතික වන්නෙමි" යනුවෙනි.

සහතිකෙන්ම සීපීඅයිඑම් හි උද්ඝෝෂනවල මුඛ්‍ය පනිවිඩය වූයේ ආන්ඩුවේ න්‍යාය පත්‍රය සහ වාම පෙරමුන ආන්ඩුවට සහාය දැක්වීමේ පදනම ලෙස ඉදිරිපත් කරන ලද පොදු අවම ක්‍රියාමාර්ගය උඩ යූපීඒ ආන්ඩුව කටයුතු කල යුතුයයි කම්කරු පන්තිය බලකල යුතු බවය.

බොහෝ සෙයින් ස්ටැලින්වාදීන් විසින් සකසන ලද මෙම පොදු අවම ක්‍රියාමාර්ගය වනාහී දේශපාලනික ප්‍රෝඩාවකි. එය සමාජ වියදම් වැඩිකිරීමේ නොපැහැදිලි පොරොන්දු සමඟ ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීමේ පොරොන්දු අනා සැකසූ අච්චාරුවකි. එහි පදනම නම් ලෝක ධනපති වෙලඳපොල සඳහා නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් බවට ඉන්දියාව පත්කිරීම සඳහා එරටෙහි මහා ලාභ ශ්‍රම කන්දරාව යොදා ගැනීමේ ධනේශ්වරයේ වැඩසටහන සමග මහා ජනතාවගේ අවශ්‍යතා ගැලපෙන්නේය යන බොරුවය.

## 'සමාජවාදය වනාහී දුර බලාපොරොත්තුවක් පමනකි'

තම පක්ෂය කම්කරු පන්තියේ හා පීඩිතයන්ගේ පක්ෂයක් යයි ද  සමාජවාදය සඳහා වූ බලවේගයක් යයි ද බොරුවට මවා පාන ගමන්ම යූපීඒ ආන්ඩුවේ හා වාම පෙරමුනු ප්‍රාන්ත ආන්ඩුවල ආයෝජන ලැදි ප්‍රතිපත්තිවලට තමන් පුදන සහාය සුජාත කිරීමට උත්සාහ කරන සීපීඅයිඑම් සමුලු යෝජනා බාගෙට- ඇත්ත සහ ගල්පැලෙන බොරුවලින් පිරී පවතියි.

යූපීඒ ආන්ඩුව "දුරදිග නොබලා විශේෂ ආර්ථික කලාපයන්හි ඉවබවනැති ව්‍යාප්තියට රුකුල් දීම" පිලිබඳව විවේචන එල්ල කරන යෝජනාව, ආන්ඩුව 2005 වසරේදී විශේෂ ආර්ථික කලාප පනත ඉදිරිපත්කල කල්හි පාර්ලිමේන්තු දෙකෙහිදී ම සීපීඅයිඑම් පක්ෂය ඊට පක්ෂව ඡන්දය දුන් බව සඳහන් නොකිරීමට වග බලාගනියි.

පසුගිය ජනවාරි 4 වන දින පැවති මාධ්‍ය හමුවකදී හිටපු බටහිර බෙංගාල මහ ඇමති හා සීපීඅයිඑම් හි වයෝවෘධ රාජ්‍යතාන්ත්‍රිකයා වන ජෝති බාසු ධනවාදය කෙරෙහි පක්ෂයේ ගැති භාවය නිර්ලජ්ජිත ලෙස කියා පෑවේ මෙසේ ය. "මෙම කාල වකවානුවේදී සමාජවාදය සාක්ෂාත් කල නොහැකිය. අප වැඩ කරමින් සිට ඇත්තේ ධනේශ්වර පද්ධතිය තුලය. ප්‍රාන්ත ආන්ඩුව සමාජ ශුභසාධන සේවාවන් පවත්වාගෙන යන අතරතුර ම පෞද්ගලික ප්‍රාග්ධනය ද එහෙයින් ප්‍රයෝජනයට ගත යුතුය." ඉන් පසුව ඔහු මෙසේද පැවසීය. "සමාජවාදය ඈත අනාගතයේ බලාපොරොත්තුවක් පමනි. සමාජවාදය අපගේ දේශපාලන න්‍යාය පත්‍රයයි. එය අපගේ පක්ෂ ලියවිල්ල තුල සඳහන් කර ඇත. එහෙත් ධනවාදය අනාගතය සඳහා ද අත්‍යවශ්‍යව ඇත."

ප්‍රාග්ධනය ආකර්ෂනය කරගැනීම සඳහා අනෙකුත් ප්‍රාදේශීය ධනපති කල්ලිවල දේශපාලන නියෝජිතයන්ට එරෙහිව බටහිර බෙංගාල ආන්ඩුව යෙදී සිටින තරගය යුක්තිසහගත කිරීමේදී, බාසුගේ අනුප්‍රාප්තිකයා වන භට්ටාචාර්ජී ප්‍රදර්ශනය කර ඇත්තේ ඊට නොදෙවෙනි  ගැති භාවයකි. 2007 පෙබරවාරි මස ෆ්‍රන්ට්ලයින් සඟරාවට භට්ටාචාර්ජී මෙසේ පැවසීය. "අපගේ ආස්ථානය පැහැදිලිය. ප්‍රාන්ත රාජ්‍යයේ සංවර්ධනය සඳහා අපට ප්‍රාග්ධනය නැතිවම බැරිය. මට නම් ප්‍රාග්ධනය මොන පාට උනත් කමක් නැත. එවන් ව්‍යාපෘතියක් එපා යයි කීමට අපට බැරිය. අප එසේ කලොත් ව්‍යාපෘතිය උත්තරකාන්ඩ් (තවත් ප්‍රාන්ත රාජ්‍යයක්) ප්‍රාන්තයට ලැබෙනු ඇත."

කොන්ග්‍රස් පක්ෂය ද ධනේශ්වරයේ වඩාත් දුර දක්නා කොටස් ද මැනවින් වටහා ගෙන ඇති කරුනක් නම් පොදුවේ පැතිර ඇති අතෘප්තිය යටපත් කර තබාගැනීමේදී සීපීඅයිඑම් හා වාම පෙරමුන ඉටු කරන තීරනාත්මක ක්‍රියා කලාපය යි. විසින් සමාජ ගැටුම් පැනනංවන වෙනස්කම් ඇතිකිරීමේ දී වමේ සහයෝගය අවශ්‍ය යයි අගමැති මන්මෝහන් සිං යලි යලිත් පැහැදිලි කර ඇත. එහෙත් වාම පෙරමුනේ සහාය ගොනු කර ගැනීමේදී දෙන්නට සිදුව ඇති සහනයන් පිලිබඳව ධනේශ්වරයේ වැදගත් කොටස් එන්ට එන්ටම කලකිරෙමින් සිටිති. විශේෂයෙන්ම සේවය අවසන් කිරීම්, දොට්ට දැමීම්, කම්හල් වැසීම් වැනි ප්‍රහාරවලදී ද ඉන්දු - එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම ක්‍රියාවට නැඟීමේදී ද සීපීඅයිඑම් හා වාම පෙරමුන නොතකා ඉදිරියට යාමට ආන්ඩුව ධෛර්යමත් විය යුතුයි ඔවුහු නිගමනය කර සිටිති.

න්‍යෂ්ටික ගිවිසුම මුල්කරගෙන වාම පෙරමුන ආන්ඩුව බිඳ දැමීමේ අභියෝගයට තමාට මුහුනපෑමට සිදුව ඇතැයි අගමැති මන්මෝහන් සිං ප්‍රසිද්ධියේ ප්‍රකාශකල තැන් පටන් ගතවූ අට මසකට ආසන්න කාලය තුල සීපීඅයිඑම් නායකයන් යලි යලිත් සපථකර ඇත්තේ යූපීඒ ආන්ඩුවේ අවසානය එසේ කඩිනම් කිරීමට තමන් කටයුතු නොකරන බවය; ඔවුන් කියන්නේ 2009 මුල භාගයේ ආන්ඩුවේ නිල කාලය අවසන් වන තෙක් ම එය තිරසාරව බලයේ පවත්වාගෙන යාම තම අරමුන බවය. ඒ සමග ම එක්සත් ජනපදයේ කොල්ලකාරී විදේශ ප්‍රතිපත්තියට ඉන්දියාව බැඳගැනීම එහි අරමුන නිසා න්‍යෂ්ටික ගිවිසුම බලගැන්වීමට ඉඩදිය නොහැකි බවක් ද ස්ටැලින්වාදියෝ කියාපාති.

වෙනත් වචනවලින් කිවහොත් ස්ටැලින්වාදීන් පැහැදිලිකර ඇත්තේ ආන්ඩුව වම සමඟ ඇතිකරගත් සන්ධානය බිඳ දමන්නේද එසේනම් ඒ කවදාද යන්න තීන්දු කිරීමේ මූලිකත්වය  කොන්ග්‍රසය හා ධනේශ්වරය වෙතටම පවරන බවය.

ඒ සමග ම ආන්ඩුව කෙරෙහි මෙන්ම තමන් කෙරේ ද මහජන අප්‍රසාදය වර්ධනය වන තතු තුල මැතිවරන සඳහාතුන්වන විකල්පයක් පිලිබඳ සීපීඅයිඑම් සාකච්ඡා ආරම්භ කර තිබේ.  ඒ භාරතීය ජනතා පක්ෂය (බීජේපී) නොතැකිය යුතු සාධකයක් වන්නා වූ ද කොන්ග්‍රසය ප්‍රධාන තරගකරු වන්නා වූ ද ප්‍රාන්තයන්හි පමනකි. මේ තුන්වන පෙරමුන වනාහී විවිධ ප්‍රාදේශීය හා කුල පදනමක පිහිටි ධනේශ්වර පක්ෂ සමග මැතිවරන සන්ධානයකි. මෙම පක්ෂ තමන් බලයේ සිටියදී ධනේශ්වරයේ නව ලිබරල් න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කල ඒවාය. එම පක්ෂවලින් බොහොමයක් ආන්ද්‍රා ප්‍රදේශය පදනම් කර ගත් තෙලිගු දේසම් පක්ෂය මෙන් මීට පෙර බීජේපී ය සමග සන්ධාන ගතව සිට ඇත.

ස්ටැලින්වාදීන් කොන්ග්‍රසය ප්‍රමුඛ යූපීඒ ආන්ඩුවට දෙන මුක්කුව යුක්ති සහගත කරන්නේ හින්දු අධිපතිවාදී බීජේපීය යලි බලයට පත්වීම වලක්වන එකම මග එය ය යන පදනම මත පිහිටා ය. ස්ටැලින්වාදී

ප්‍රලාපයක් වන මෙය වනාහි ප්‍රතිගාමිත්වය වැලැක්විය හැක්කේ ධනේශ්වරයේ වඩාත් ප්‍රගතිශීලීයයි නම් කරන ලද කොටස් සමග සන්ධාන ගත වීමෙන්ය යන සුපුරුදු මිථ්‍යාවයි.

ආන්තික දක්ෂිනාංශයේ වැඩෙන බලයවනාහී ධනේශ්වර පාලනයේ අර්බුදය හා ධනවාදයේ පිලිකාගත භාවය පිලිබඳ රෝග ලක්ෂනයකි.

දශක ගනනාවක් තිස්සේ ඉන්දියානු ධනේශ්වරයට කම්කරු පන්තිය යටත්කර තැබීම මගින් පෙර කුඩා බලවේගයක් ලෙස පැවති හින්දු දක්ෂිනාංශය ඉන්දියාවේ දෙවන විශාලතම පක්ෂය බවට පරිවර්තනය කිරීම සඳහා මාවත සැබවින්ම හෙලි පෙහෙලි කර දුන්නේ ද ස්ටැලින්වාදීන්ම ය. 1970 ගනන් මුල හා මැද එනම් අවශේෂ ලෝකය මෙන්ම ඉන්දියාව ද ආර්ථික අර්බුදයෙන් හා සමාජ අරගලවලින් ඇලලී ගිය තතු තුල ඉන්දිරා ගාන්ධිගේ හදිසි නීති පාලනය ආරක්ෂා කිරීමට තරම් දුර ගමන් කල සීපීඅයිඑම් හි සහෝදර පක්ෂය වන සීපීඅයි (ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය) කොංග්‍රසය සමග සන්ධාන ගත විය. ඒ අතර සීපීඅයිඑම් කම්කරු පන්තිය ගාන්ධිට එරෙහිවූ ධනේශ්වර විපක්ෂයට යටත් කලේ බීජේපීයේ පූර්වගාමී ජනසංග් සංවිධානය ද ප්‍රධාන හවුල්කරුවකු ලෙස ඇතුලත් කර ගනිමින් 1977 මැතිවරනය තරග කිරීම සඳහා තනාගත් ජනතා පක්ෂ අච්චාරුවට සහයෝගය දීමෙනි.

1960 ගනන්වල අග හා 1970 ගනන්වල මුල කම්කරු පන්තියේ හා ගොවි ජනතාවගේ නැගිටීම ස්ටැලිනවාදීන් විසින් පාවාදීමෙන් පසුව 20 වන සියවසේ අවසාන දශක දෙක තුල හින්දු දක්ෂිනාංශයට හා සියලු ආකාරයෙන්ම ප්‍රාදේශීයවාදී හා කුලවාදී පක්ෂවලට කොන්ග්‍රසය කෙරෙහි වර්ධනය වන ජනතා නොසතුටෙන් වාසි අත්කර ගැනීමට හැකියාව ලැබුනි. මෙය සිදු වූයේ පලමුව මහජනතාවගේ කිසිදු මූලික ගැටලුවකට විසඳුම් ලබාදීමට පශ්චාත් ස්වාධීනතා ජාතික ව්‍යාපෘතිය අසමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස ද දෙවනුව දරිද්‍රතාවය හා ආර්ථික අනාරක්ෂිත භාවය උග්‍රකල 1991 දී කොන්ග්‍රසය මූලිකත්වය ගත් නව ලිබරල් ප්‍රහාරයන්හි ප්‍රතිඵලයක් ලෙස ද වේ.

යූපීඒ ආන්ඩුවට පුදන තම සහයෝගය යුක්ති යුක්ත කරන සීපීඅයිඑම් කොන්ග්‍රස් යෝජනාවලිය මෙසේ ද කියයිඃ "ඔවුන්ගේ (හින්දු අධිපතිවාදීන්ගේ) ශක්තිය අවතක්සේරු කිරීම වැරැද්දක් වනු ඇත. මහජනතාවගේ වැඩෙන අතෘප්තිය හා ආර්ථික අමාරුකම් හමුවේ එම අතෘප්තිය භේදකාරී වාර්ගික දේශපාලනය තුලට හරවා යැවීමේ විභවය එයට පවතී."

එහෙත් මෙවැන්නක් සිදුවිය හැක්කේ සීපීඅයිඑම් හා වාම පෙරමුනට පින්සිදු වන්නට කම්කරු පන්තිය කොන්ග්‍රසයට ගැටගසා තිබෙන හෙයින්ම පමනි. ධනේශ්වරයේ සම්ප්‍රදායික පාලක පක්ෂයවූයේ ද ආර්ථිකය අපාලිත කිරීමේ, පුද්ගලීකරනයේ, හා වෙලඳපොලකරනයේ ක්‍රියාමාර්ගයෙහි මූලිකයා වූයේ ද කොන්ග්‍රසයයි. අනාගමිකවාදයට කොන්ග්‍රස් පක්ෂයේ කැපවීමක් ගැන ස්ටැලින්වාදය මොන පව ඇදබැව ද අවම වශයෙන් 1947 උප මහාද්වීපය වාර්ගික වශයෙන් බෙදූ කාලයේ පටන්ම කොන්ග්‍රසය හින්දු දක්ෂිනාංශය සමග යලි යලිත් සම්මුති ගසමින් වර්ගවාදයට අනුබල දී තිබේ. පසුගිය දෙසැම්බරයේ ගුජරාට් මැතිවරනවල දී 2002 වසරේ ගුජරාටය තුල මුස්ලිම් විරෝධී ප්‍රහාරයන්ට සෘජුව ම සම්බන්ධව සිට පසුව බීජේපීයෙන් කැඩීගිය නායකයන් කන්ඩායමක් සමග කොන්ග්‍රසය මැතිවරන සන්ධානයක් ගොඩනගා ගත්තේය.

## ස්ටැලින්වාදීන්ගේ පව අධිරාජ්‍ය විරෝධය

වොෂින්ටනය ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම දැක ගන්නේ තමන්ගේ මිලිටරි-භූ-දේශපාලනික කක්ෂය තුලට ඉන්දියාව ඇද ගැනීමේ උපක්‍රමයක් ලෙස යයි සීපීඅයිඑම් ලියවිල්ල නිවැරදිව අනතුරු අඟවයි. සීපීඅයිඑම් එම ගිවිසුමට විරුද්ධ වන අතර ඉරාකය ආක්‍රමනය කිරීම හා වාඩිලාගැනීම සහ පලස්තීන ජනයා මිරිකා දැමීමට වොෂින්ටනය දෙන දෘඪතර සහයෝගය ඇතුලු එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අපරාධ පිලිබඳ හෙලා දැකීම් සම්මේලන යෝජනාව පුරා දක්නට ලැබේ.

එහෙත් සකල ප්‍රතිමල්ල ධනේශ්වර කන්ඩායම් සහ ඔවුන්ගේ ජාතික රාජ්‍යයන්ට එරෙහිව ජාත්‍යන්තර කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලනික බලමුලුගැන්වීම මත පදනම් වන අව්‍යාජ අධිරාජ්‍ය-විරෝධී ප්‍රතිපත්තියක් සමග ස්ටැලින්වාදීන්ගේ මෙම එක්සත් ජනපද-විරෝධී පූච්චානම්වලට මෙලෝ සම්බන්ධයක් නැත.

ඉන්දියානු ධනේශ්වරයේ සාම්ප්‍රදායික "නො බැඳි ප්‍රතිපත්තිය" වර්නනා කරමින් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට විරුද්ධවන සීපීඅයිඑම් ඒ වෙනුවට විකල්පයක් ලෙස යෝජනා කරන්නේ බහු-ධ්‍රැවීය ලෝකයක් සඳහා ඉන්දියාව, රුසියාව හා චීනය අතර සන්ධානයකි. දේශීය ප්‍රාග්ධනය ද එක්සත් ජනපද, යුරෝපීය හා ජපාන බහු ජාතික සංගතයන් ද විසින් චීන කම්කරු පන්තිය මෘග ලෙස සූරාකෑමේ මුලසුන බීජිං තන්ත්‍රය විසින් ගෙන තිබෙන නමුත් සීපීඅයිඑම් චීනය සමාජවාදී රටක් ලෙස උත්කර්ෂයට නංවයි. "බහු-ධ්‍රැවීයත්වය දිරිමත් කරන්නාවූ ද එක්සත් ජනපදයේ තනිබලයට හා එහි ආධිපත්‍යධාරී විධික්‍රමවලට එරෙහිව ක්‍රියා කරන්නාවූ ද ප්‍රධාන ධාරා පවතී. රුසියාව තම ස්වාධීන භූමිකාව හා ස්වෛරී හිමිකම් අවධාරනය කිරීමේ යෙදී සිටී." සීපීඅයිඑම් යෝජනාව එසේ උදම් අනයි.

සීපීඅයිඑම්, යූපීඒ ආන්ඩුව මිලිටරිමය බලය ගොඩනගන ආකාරය විවේචනය කල ද ලෝක

වේදිකාව මත ඉන්දීය රාජ්‍යයට ප්‍රගතිශීලී භූමිකාවක් ඉටු කල හැකි ය යයි කියා පාමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ නිත්‍ය අසුනක් හිමි කර ගැනීම සඳහා ඉන්දීය ධනේශ්වරයට පවතින අරමුනට මුලුමනින් සහාය දෙයි. නේපාලය තුල මාඕවාදී කැරලිකාරීත්වය අවසන් කිරීම සහ ධනේශ්වර පාලනය ප්‍රතිස්ථාපනය කිරීම ඉලක්ක කර ගෙන සම්මුතියක් ඇටවීමට කපුකම කිරීමට ඉන්දීය ආන්ඩුවට සහාය දීමේ දී සීපීඅයිඑම් මූලික ක්‍රියා කලාපයක් ඉෂ්ට කර ඇත.

සීපීඅයි සහ එයින් 1964 දී බිඳී වෙන්වුනු සීපීඅයිඑම් යන දෙපක්ෂය ම දශක ගනනාවක් පුරා කොංග්‍රසයට හෝ වෙනත් ධනේශ්වර දේශපාලන රූපාකාරයකට කම්කරු පන්තිය යටත් කිරීම යුක්ති සහගත කලේ ස්ටැලින්වාදී-මෙන්ශෙවික් අවධි දෙකේ විප්ලව න්‍යායේ පදනම මත යි. අධිරාජ්‍යවාදයට විරුද්ධව ප්‍රථමයෙන් බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබා ගැනීමටත් ඉන් අනතුරුව ඉඩම්හිමිවාදය, කුල පීඩනය සහ යටත් විජිතවාදයේ හා වැඩවසම් පසුගාමීත්වයේ අනෙකුත් උරුමයන් අවසන් කොට ජාතික ආර්ථිකයක් ගොඩ නැගීමටත් ජාතික ධනේශ්වරයේ ප්‍රගතිශීලී යයි කියනු ලබන අංශයට සහයෝගය දිය යුතුයැයි ඔවුහු තර්ක කලහ. ස්ටැලින්වාදීන් අවධාරනය කල පරිදි සමාජවාදය සඳහා කිසිදු අරගලයකට ඉඩක් පැවතිය හැකි වූයේනම් ඒ ධනේශ්වරය සමග සන්ධානගතව ප්‍රජාතාන්ත්‍රික විප්ලවය සම්පූර්න කිරීමෙන් පසුව පමනි.

අධිරාජ්‍යවාදයට විරුද්ධවීම පිලිබඳ සියලු ව්‍යාජයන් අතහැර දමා ලෝක ආර්ථිකය තුලට ඉන්දියාව මුලුමනින් අන්තර්ග්‍රහනය වීමට සහාය දෙමින් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග මූලෝපායික හවුල්කාරීත්වයක් සඳහා අර අදිමින් සිටින ඉන්දියානු ධනේශ්වරයේ දේශපාලනික ආධිපත්‍යයට කම්කරු පන්තිය අභියෝග නො කල යුතු යයි කියා සිටීමේ දී ස්ටැලින්වාදියෝ වඩ වඩා අවධාරනාත්මක වෙති. ඔවුන් තර්ක කරන්නේ බීජේපීයට එරෙහිව කොන්ග්‍රසයට සහාය දිය යුතු බවය; කම්කරු පන්තිය සහ ගොවි ජනතාව ධනවාදයේ ලාභ-පිපාසිත බලහත්කාරය හා තමන්ගේ ඉඩම් විදේශීය ආයෝජකයන්ට තෑගි දීම පිලිගත යුත්තේ ධනවාදී කාර්මීකරනය "සමාජවාදය සඳහා ද්‍රව්‍යමය පදනම" සම්පාදනය කරන හෙයිනි.

පසුගිය 30 වසර පුරා රටෙහි ජනගහනයෙන් හතරවන විශාලතම ප්‍රාන්තය පාලනය කොට ඇති සීපීඅයිඑම් ඉන්දියානු දේශපාලන සංස්ථාපිතයේ අත්‍යවශ්‍ය සංරචකයකි; ඉන්දියානු ධනේශ්වරයට නැතුව බැරි මුක්කුවකි. ට්‍රොට්ස්කිවාදී නො නවතින විප්ලව න්‍යායේ වැඩපිලිවෙල මත පදනම්ව ඉන්දියානු කම්කරු පන්තියේ නව විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගිය යුතු ය. ඉන්දීය කම්කරු පන්තිය, ධනේශ්වරයටත් එහි සියලු පක්ෂවලටත් ප්‍රතිවිරුද්ධව ඉන්දියාවේ වැඩ කරන ජනයා කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා බලමුලු ගැන්වීම සහ ඉන්දියාවේ වැඩ කරන ජනයාගේ අරගලය, අධිරාජ්‍යවාදයට හා ගෝලීය ප්‍රාග්ධනයට එරෙහිව සමාජවාදය සඳහා ජාත්‍යන්තර කම්කරු පන්තියේ අරගලය සමග ඒකාබද්ධ කිරීම ඉලක්ක කර ගත් ප්‍රජාතාන්ත්‍රික සහ සමාජවාදී ඉල්ලීම් ඇතුලත් වැඩ පිලිවෙලක් ඉදිරිපත් කොට සටන් වැදිය යුතු ය.